13. රෝහණධීර, මැන්දිස්, (1965), **කුරුණෑගල යුගයේ ඓතිහාසික පසුබිම**, පි., 28-35, **සාහිත්‍ය ත්‍රෛමාසික සඟරාව**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
14. ලියනගමගේ, ඒ. (1989), **මධ්‍යකාලීන ලංකා ඉතිහාසය**, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
15. ලියනගමගේ, ඒ. (2005), **හස්ථිශෛලපුර ඓතිහාසික පසුතලය** පි., 201-214, **කුරුණෑගල්පුර යුගය**, සංස්: දෙගම්මැද සුමනජෝති හිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
16. ලංකා විශ්වවිද්‍යාල **ලංකා ඉතිහාසය** I, II, (1964), (1972), විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.
17. විපස්සි හිමි, පින්නගොඩ කන්දේ., (2005), **පණ්ඩිවරු**, පි., 79-90, **කුරුණෑගල්පුර යුගය**, සංස්: දෙගම්මැද සුමනජෝති හිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
18. සන්නස්ගල, පුංචිබණ්ඩාර. (1964), **සිංහල සාහිත්‍යවංශය**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
19. සන්නස්ගල, පුංචිබණ්ඩාර. (1965), **කුරුණෑගල සාහිත්‍යොන්නතිය සහ එහි විශේෂාංග** පි., 14-18, **සාහිත්‍ය ත්‍රෛමාසික සඟරාව**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
20. සිරිවීර, ඉන්ද්‍රකීර්ති., (2002), **රජරට ශිෂ්ටාචාරය හා නිරිතදිග රාජධානි**, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.
21. සුමනජෝති හිමි, දෙගම්මැද., (2005), **කුරුණෑගල් නුවර**, පි., 1-17, **කුරුණෑගල්පුර යුගය**, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
22. සුමනජෝති හිමි, දෙගම්මැද., (1965), **කුරුණෑගල්පුර සමයේ ශාසනික තත්ත්වය** පි., 19-27, **සාහිත්‍ය ත්‍රෛමාසික සඟරාව**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
25. Nicholas, C.W, (1963), "Historical Topography of Ancient and Medieval Ceylon", Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Vol: VI, Colombo.
26. Culavamsa, ed: Geiger, (1925, 1927), Wilhelm, Vol: 2, (PTS), London.
27. Modder, F.H., (1893), "Kurunegala Vistara: with notes on Kurunegal Ancient and Modern, Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Vol:III, No: 44, Colombo.
28. Epigraphia Zeylanica, (1928-1933), Vol-III & V.
29. Bell, H.C.P., (1892), XIX, Report on the Kegalle District of the Province of Sabaragamuwa., Government Printer, Ceylon.
30. Pathmanathan, S, (1978), The Kingdom of Jaffna, Part-1, Ceylon Newspapers, Ltd, Colombo.
31. Indrapala, (1970), "The Origin of the Tamil Vanni Chieftaincies of Ceylon", The Ceylon Journal of the Humanities, Vol-I, No: 3, July-1970, University of Ceylon, Peradeniya, p. 111-140.
32. Ranawella, Sirimal, (1999), The Inscription of Apa Kitadbo and kings Sena I, Sena II, and Udaya III, Sridevi printers, Dehiwala.
33. Gunesingha, P. A.T., (1987), The Political History of the kingdoms of Yapahuva, Kurunegala and Gampola, Lake House, Colombo.

# 41

# සිංහල ජනකතාවෙන් පිළිබිඹු වන දේශීය ජන ජීවිතය

*අනුෂා මැණික් කුමාරි*

ජනකතාව ලෝකය පුරා ම ප්‍රචලිත වූ, සැම රටක ම, සංස්කෘතියකම දකින්නට පුළුවන් වූ ජනශ්‍රැති අංගයකි. අකුරු ලිවීමට කියවීමට නොදන්නා ජනතාව අතර මෙන් ම සාක්ෂරතාවෙන් ඉහළ සමාජවල ද ජනකතාව නම් සංහිත්‍යාංගය ජනප්‍රිය ව පවතී. ජනකතාව යනු කතාන්දර විශේෂයකි. මේවායේ අන්තර්ගත කතාවල එන සිද්ධිදාමය අතර මුල-මැද-අග මනාව ගළපා කතාව ගොතා ඇත. ජනකතා අසා ගෙන සිටින විට රස විඳින්නා තුළ කුතූහලයක් ඇති කිරීමක් සිදු වන අතර කුතූහලය උද්දීපනය කිරීම උදෙසා අධිස්වාභාවික චරිත හෝ අද්භූත සිද්ධි එකතු කිරීමක් සිදු කර ඇත.

මානව ජීවිතයේ සුවිශේෂ අවස්ථාවල දී මේ ජනකතා ප්‍රයෝජනයට ගැනේ. කුඩා දරුවන්ට "සීයා, ආච්චි" වැනි වැඩිහිටි ඥාතියෙකු විසින් ජනකතා කියා දෙනු ලැබේ. මේ ජනකතා දරුවාගේ සමාජානුයෝජනය හා සම්බන්ධ වෙයි. ඔහු හැදෙන වැඩෙන විට ඔහුට අවශ්‍ය දැන නුවණ ඒ ජනකතාවලින් ලැබෙයි. ගැහැනු දරුවෙකු වැඩිවියට පත්වූ පසු ද ඇයට ඇවසි දැනුම ලබා දීමට ජනකතා බොහෝ සේ ඉවහල් වෙයි. දරුවන්ගේ සිත් ගන්නා අන්දමට සකස් වූ ජනකතා ළමා ලෝකයේ ඉතා ජනප්‍රිය වූ කතාන්දරය.

ජනකතාවල අන්තර්ගත චරිත මඟින් ජනයාගේ භෞතික සංස්කෘතිය හා බැඳුණු සිද්ධි මෙන්ම අභෞතික සංස්කෘතිකාංග පිළිබඳ ව ද තථ්‍ය තොරතුරු අනාවරණය වේ. මේ නිසා දේශීය ජනජීවිතය මැනවින් විවරණය කර දැක්වීමට ජනකතාව ඉවහල් වේ. ශ්‍රී ලාංකේය ජනතාවගේ ආහාරපාන, ඇඳුම් පැළඳුම්, ජීවිකා වෘත්තීන්, වාසස්ථාන මෙන් ම ඔවුන් තුළ පැවති ඇදහිලි, විශ්වාස ආදිය පිළිබඳව දළ විමසුමක් මේ ලිපිය මඟින් ඉදිරිපත් කෙරේ.

දේශීය ජනයාගේ ආහාර අතර ප්‍රමුඛස්ථානය හිමිවූයේ බත්වලටය. ශ්‍රී ලංකාවෙන් වැඩිපුර ප්‍රදේශයක ගොවිතැන් කටයුතු සිදුකළ අතර වී ගොවිතැන ඒ අතර ප්‍රධාන විය. ඇතැම් ප්‍රදේශයක වැසියෝ තුන් වේලම බත් අනුභව කළහ. එයට නිදර්ශනයක් ලෙස,

> "පානම්පත්තුවේ උන්දලා තුන් වේලටම බත් කනවා ...... පානම්පත්තුව පුරා එක සාගරයට කුඹුරු තියෙනවා. ඒ නිසා ඕනතරං කැකුලු හාල් තියෙනවා ..."[1]

යන උද්ධෘතය දැක්වි හැකිය.

ව්‍යඤ්ජන වශයෙන් කරවල හා එළවලු වර්ග භාවිත කෙරිණි. මීට අමතර ව පොළොස් ඇඹුල හා අලකොළ මාළුව ගැන ද කියවේ. වනගත ගම්මානවල ජීවත් වූ වැසියෝ සතුන් දඩයම් කොට ඔවුන්ගේ මස් ද සුලබ ව ආහාරයට ගෙන ඇත්තාහ. මීට අමතර ව තිත්තයන් මැල්ලුම, කුරක්කන් පිට්ටු වැනි ආහාර වර්ග මෙන් ම කුරක්කන් තලප ද ආහාරයට ගෙන ඇත. පානම්පත්තුවේ කුරහන් තලප කෑම සඳහා හේන්ගොවීහු දඩමස් හොද්දක් සාදාගෙන ඒ සමග කුරහන් තලප අනුභව කළහ.

> "තලප ගිලින්ඩ නම් මස් හොද්දක් ඕනමයි. තලප ගිලින්ඩ හදන මස් හොද්දට කුරක්කන් පිටි ටිකක් මුහුං කොරලා ගත්තම හොද්ද හොඳ අටකමට තියෙනවා. එතකොට තලප ගිලින්ඩ හොද්ද පංකාදු හතයි"[2]

කුරක්කන් රොටීද හේන්ගොවීන් අතර භාවිත වූ ප්‍රධාන ආහාරයකි. හේන්ගොවීන් බොහෝ විට දවල් ආහාරය සඳහා අනුභව කර ඇත්තේ ද කුරහන් රොටීය. තවද මංගල සම්මත ආහාරයක් වන කිරිබත්වලට ද එකල උසස් ස්ථානයක් හිමි ව තිබුණි. ඕනෑ ම සුභ කටයුත්තක් සඳහා කිරිබත් පිසීම අනිවාර්යෙන් සිදු කෙරිණි. වේලක් පිරිමසා ගැනීම සඳහා කිරිබත් පිස ගන්නා ලද අවස්ථා පිළිබඳ ව කියවේ.[3]

බත්, තලප, පිට්ටු, රොටී හැරුණු විට කොස්, දෙල්, අල, බතල වැනි දේවල් ද දේශීය ජනයා ආහාරයට ගෙන ඇත. සෑම ගෙවත්තක ම පාහේ කොස්, දෙල් ආදි ගස් වර්ග තිබූ බව සඳහන් වේ. කොස් රසයෙන් මෙන් ම ගුණයෙන් ද අනූන ආහාරයක් වූ නිසා ධනවත්, දිළිඳු කවුරුත් රුචිකමක් දක්වූහ. අල වර්ග අතර ද රාජඅල, හබරල, හිගුරල, කටුඅල, කුකුළල, වැල් අල, ඉනි අල, කිරි අල, බතල වැනි ඒවා ගැමියෝ හේන්වල මෙන් ම ගෙවතුවල ද වවාගත්හ. මේ අල වර්ග තම්බා පොල් මුසු කරගෙන හෝ ලුණු මිරිසක් සමඟ ආහාරයට ගැනීමෙන් වේලක් පිරිමසා ගත හැකි විය.

කැවිලි වර්ග අතර ද කැවුම්, වෙල්ලවැහුම්, මෙන් ම අත්සුනු හෙවත් අග්ගලා ද එකල ජනයා අතර ජනප්‍රිය වී ඇත. මේවා සෑදීමේ දී එකල ගෘහණියෝ පොල් හෝ කිතුල් පැණි යොදා ගත්හ. අතීතයේ ජනයා අතර පොල් හා කිතුල් මැදීම ද ජනප්‍රිය ව සිදු කෙරිණි. මත් ද්‍රව්‍යයක් ලෙස ද පොල් රා, කිතුල් රා බී ඇත.

පාන වර්ග අතුරින් කිරිවලට ප්‍රමුඛස්ථානයක් හිමිවිය. කිරි සඳහා එළ හරක් ඇති කළ අතර ඔවුන්ගෙන් ලබා ගත් කිරි පෝෂ්‍යදායි ආහාරයක් විය. මී කිරි පැණිත් සමග අනුභව කෙරිණ. කැඳ වර්ගවලට ද එකල ජීවත් වූ ජනයා රුචිකමක් දක්වන ලදි. දියබත් කැඳ, කිරි කැඳ, ලුණු කැඳ, බැදිහාල් කැඳ, කොළ කැඳ යනුවෙන් කැඳ වර්ග ගණනාවක් භාවිත විය. එදා සමාජයේ නිවෙස්වල කැඳ පාතරාසය වශයෙන් යොදා ගැනුණි. පාන්දරින් අවදි වී කැඳ පිසීම ගෘහණියකගේ වගකීමක් ලෙස



සැලකුණු බව 'අහංකාර රජකුමරිය' නමැති ජනකතාවෙන් හෙළි වෙයි.[4] මේ කැඳ වර්ග අතර ලුණු කැඳ, දියබත් කැඳ, බැදිහාල් කැඳ යන ඒවා යමෙක් රෝගාතුර වූ අවස්ථාවක ඖෂධීය පානයක් ලෙස ද පිළියෙල කර දෙනු ලැබේ. මීට අමතර ව කෝපි පානය කිරීම ද අතීතයේ සිට ජනතාව අතර පුරුදු වී තිබුණ ද යුරෝපීයයන්ගේ ආගමනයෙන් පසු ඔවුහු මෙරට ජනයාට තේ බීමට ද පුරුදු කළහ. වර්තමානයේ පාන වර්ග අතර තේ සඳහා ද සුවිශේෂ ස්ථානයක් හිමි වේ. මේ අනුව බලන කල දේශීය ජනයා ආහාරයට ගත් ද්‍රව්‍ය අතර ගෙවත්තේ වවාගත් පළතුරු වර්ග ද විය. මීට අමතර ව තල, මුං, මෑ, මෙනේරි වැනි ධාන්‍ය වර්ග ද වගා කර ආහාරයට ගත් අතර අතිරික්ත යමක් වී නම් භාණ්ඩ හුවමාරු ක්‍රමය යටතේ හුවමාරු කර ගැනීම ද සිදුවිය.

සිංහල ජනකතාවෙන් හෙළිවන පරිදි දේශීය ජනයා පරිහරණය කළ ඇඳුම් පැලඳුම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී, විසිවන සියවසේ දශක කිහිපයක් යන තෙක් ම ඔවුන් චාම් හා සරල ඇඳුම් පැලඳුම්වලට පුරුදු වී සිටි බව පෙනේ. දිගාමඩුලු ප්‍රදේශයේ ජනයාගේ ඇඳුම් පැලඳුම් පිළිබඳ ව සඳහන් වන්නේ මේ ආකාරයටය.

> "පිරිමියෙකුට වුවමනා සරමත් අමුඩයත් පමණි. තවත් සරමක් ඇතොත් ඒ වැඩිමනත් දෙයකි. බොහෝ දෙනාට ගමන් බිමන් ඇත්තේ නැත. තිබුණත් ඊට කුමක් නමුත් උඩුකය වැසෙන්නක් තිබීම හෝ ලබාගත හැකි වීම සෑහෙයි"[5]

පිරිමි වැඩපළෙහි යෙදෙද්දී හා දිය නෑමේ දී අමුඩය භාවිත කළහ. සුවිශේෂ ගමනක් යාමට ඇත්නම් පමණක් අමුඩයට උඩින් රළු, වර්ණවත් වස්ත්‍රයක් ඇඳ ගන්නා ලද අතර එය ඉග සිට දණහිස දක්වා දික් විය. සුදු පැහැති රෙද්දක් හෝ සරමක් ඊට උඩින් ඇඳ ගැනිණ. ස්ත්‍රීන් ගෙදරදොර ඇඳුම් පැලඳුම් ගැන වැඩි සැලකිල්ලක් නොදැක්වූ බවත්, වැඩ කටයුතු සඳහා පහසු වස්ත්‍රයක් ඇග ලා ගත් බවත් රොබොට් නොක්ස් සඳහන් කරයි.

> "එසේ වුව ද බැහැර යන කල ඔවුහු සේලයක් හා හැට්ටයක් ඇඳ අබරණ ද පැලඳ ගෙන විසිතුරු ලෙස සැරසී ගියහ. අතේ රිදී වළලු දමා පයෙහි පාමුදු දා අතැඟිලිවල රිදී මුදු ද පැලඳ ගත්හ. ගෙළේ පබළු මාලයක් හෝ කැටයම් කර රන් පෙවූ රිදී හෝ පැලැන්දහ......"[6]

ගැමි කාන්තාව ගමන් බිමන් යන විට නෙරිය තියාලා, සේලේ ඇඳලා හවරි තියලා කොණ්ඩේ බැඳලා ගමන් යාමට සැරසෙයි. මීට අමතර ව කාලයාගේ ඇවෑමෙන් කාන්තාවන් 'කම්බා' නමින් හැඳින්වුණු ඝන වස්ත්‍ර විශේෂයක් ඇඳ ඇත. මේවා ඉරි හෝ කොටු සහිත විය. කෙනෙක් අත් දිගට හැට්ට ඇඳි අතර උඩරැටියන් අත් බෝරිච්චි කොට හැට්ට ඇඳ විළි වසා ගෙන ඇත. කාන්තාවෝ සිය වත්කමේ හැටියට

කන්වල තෝඩු, කරාබු ආදිය පැලැන්දාහ. මේ ආකාරයට නූතන සමාජයේ මෙන් සංකර නොවූ චාම් සරල ඇඳුම් පැලඳුම් මුල් කාලයේ දේශීය කාන්තාවන් ඇඳ පැළඳ ඇත.

දේශීය ජනජීවිතය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී ජනකතාවල සඳහන් ආකාරයට ලක්වැසියාගේ ප්‍රධානතම ජීවනෝපායන මාර්ගය වූයේ ගොවිතැනයි. එය මඩ ගොවිතැන හා ගොඩ ගොවිතැන ලෙස බෙදා දැක්විය හැකිය. මඩ ගොවිතැනේ දී කුඹුරු ගොවිතැන ප්‍රධාන වූ අතර ගොඩ ගොවිතැනේ දී හේන් ගොවිතැනට ප්‍රමුඛස්ථානය හිමි විය. එකල රජවරුන් පවා ගොවිපළේ කටයුතු පිළිබඳ නිපුණතාවක් දැක්වූ අතර රාජසිංහ රජතුමා ද අප්‍රසිද්ධ වේශයකින් පැමිණ කෙතක ගොයම් කැපූ බව ජනකතාවල සඳහන් වේ.[7] ගොවිතැන හා සම්බන්ධ කටයුතුවල දී ගමරාළට ප්‍රමුඛස්ථානයක් හිමි විය. 'කටකාර හේනයා' නමැති කතාන්දරයේ ගමරාළ හඳුන්වා දී ඇත්තේ මෙසේය.

"ගමරාළ කියන්නේ කාට ද දන්නවා ද? ගමරාළ කියන්නේ ගමේ ඉන්න හැමදෙනා ම එකතුවෙලා ගමේ ලොක්කා හැටියට පත් කර ගන්නා මිනිහා. එහෙම පත් කර ගන්නේ ඉතිං වත්පොහොසත්කම් තියෙන කෙත් වත් හරකබාන ඇති කාරණා දන්න කෙනෙකුයි."[8]

ගමරාළ හෙවත් ගම මහගේ පත් කරන ලද්දේ පාරම්පරික උරුමය මතය. ගමරාළ කෙනෙකුගේ මරණින් පසු ව ඔහුගේ පුත්‍රයෙකුට හෝ පුත්‍රයෙකු නොවී නම් වැඩිමහලු දියණියගේ ස්වාමිපුරුෂයාට හෝ ඒ තනතුර හිමිවිය.

ගොඩ ගොවිතැනේ දී හේන්වල බොහෝ කොට වවන ලද්දේ කුරහන්ය. මීට අමතර ව තල, මුං, මෙනේරි, අමු, කොල්ලු, බඩ ඉරිඟු ආදි ධාන්‍ය වර්ග ද වවන ලදි. හේන් වගාවේ දී පැල් රැකීම අනිවාර්ය විය. වන සතුන්ගෙන් වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ගොවීහු ගිනි මැල ගසාගෙන පැල් කවි කියමින් රාත්‍රිය පහන්වන තුරු හේනේ සිටියහ. ඇතැම් ජනකතාවක හමස් පැල් රැකීමක් පිළිබඳ ව සඳහන් වේ.

සත්ත්ව පාලනය ද ජන ජීවිතයෙහි ප්‍රචලිත ව පැවතුණි. ගැමියෝ සී සෑම, කොළ මැඩවීම ආදී ගොවිපොළේ කටයුතු සඳහා මී ගවයන් යොදා ගත්හ. එකල භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගත් කරත්තවලට ද ගවයන් ප්‍රයෝජනවත් විය. 'බර අඩු කිරීම' කතාන්තරයේ එන සේතං ද ගොන් කරත්තයෙන් ජීවත් වූ අයෙකි.[9] ජනයා විසින් ඇති කරන ලද වෙනත් සතුන් අතර එළුවන්, බූරුවන්, කුකුළන් වූ බව ද ජනකතාවල සඳහන් වේ.

දේශීය ජනයාගේ වාසස්ථාන ඉතාමත් චාම් හා සරල විය. ගැමි නිවසක හිරු එළිය හා වාතාශ්‍රය ලබා ගැනීම සඳහා කවුළු දෙකක් හා දොරක් පමණක් තිබුණි. ගෙයි බරාදයේ දිග පිලක් විය. පිරිමින්ට රාත්‍රී කාලයේ නිදා ගැනීමටත්, ගැහැනුන්ට වාඩි වී ඕපාදූප කතා කිරීමටත් මෙය කදිම ස්ථානයක් විය. අමුත්තකු පැමිණි විට මේ පිලට පැදුරක් එලා වාඩි වන්නට සලස්වන ලදී. ගෙවල් තැනීමේ දී වනයෙන් ලී දඬු කපාගත් අතර වහලවල් සෙවිලි කිරීම සඳහා බටකොළ, ඉලුක්, තල් අතු, පිදුරු වැනි ඒවා යොදගන්නා ලදි. පසුකාලයේ දී පොල් අතු යොදා ගැනිණ. බිම මැටි ගා මට්ටම් කරගෙන ගොම ගා පිරිසිදු ව තබාගත් අතර බිත්තිවල ද මැටි හා පිරිසිදුව ගැමි ගෙවල් තබාගෙන ඇත. මෙය ගෘහණියගේ වගකීමක් විය.



රටේ සාමාන්‍ය ජනයාගේ පමණක් නොව වත්පොහොසත්කම් ඇති ගමරාළගේ පවා නිවස බෙහෙවින් කුඩා වූ හෙයින් උත්සව ආදි විශේෂ අවස්ථාවන් සඳහා තාවකාලික මඩු ඉදිකර ගැනීමට ඔවුන්ට සිදුවිය. 'ගමරාළගේ කට ඇති දුව' නමැති ජනකතාවේ එන ගමරාළට ද දියණියගේ විවාහ මංගල්‍යය සඳහා මඩු ඉදි කරන ලෙස රජ දැනුම් දෙයි.[10]

ගැමි ජනතාව ගොවිතැනින් ලබා ගත් අස්වනු තැන්පත් කරලීම සඳහා ගැමිගෙවල අටු තනා තිබුණි. ධාන්‍ය අටු තනන ලද්දේ ගෙමිදුල්වලය. බිස්ස, වරුස හා පන්දලම යන නම්වලින් අටුව හැඳින්විණ. අටු ඉදි කරන ආකාරය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් විය. අටු තනා තිබුණේ තරමක් වත්පොහොසත්කම් ඇති ජනයාගේ නිවෙස්වලය.

ඉහත සමස්තයට අනුව ශ්‍රී ලාංකේය ජනයාගේ කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, ආහාර පාන, ඇඳුම් පැලඳුම්, වාසස්ථාන පිළිබඳ ව අවබෝධයක් ජනකතාවන්හි දැකිය හැකිය. මේ පිළිබඳ ව අධ්‍යයනය කිරීමෙන් දේශිය ජනජීවිතයේ සංස්කෘතිකාංග හර පද්ධති පිළිබඳව ද මනා අවබෝධයක් ලබා ගැනීමට ජනකතාවලින් ලැබෙන පිටිවහල අතිමහත්ය.

## පාදක සටහන්

1. ගුණසෝම, ගුණසේකර., **පානම්පත්තුවේ ජනකතා**, සාර ප්‍රකාශන, ප්‍රථම මුද්‍රණය 1992, 25 පි.
2. ගුණසෝම, ගුණසේකර., **පානම්පත්තුවේ ජනකතා**, සාර ප්‍රකාශන, ප්‍රථම මුද්‍රණය 1992, 25 පි.
3. දේවප්‍රිය, සිරිසේන., **ජනප්‍රවාද සහ ජනවහර**, ප්‍රථම මුද්‍රණය 1993, 11 - 12 පිටු.
4. රංජන්, මායා, **පිටිසර මිනිස්සු**, සීමාසහිත එම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, ප්‍රථම මුද්‍රණය 1994, පිටු 26-27.
5. කරුණාරත්න, ඩේවිඩ්., **එදා හෙළදිව**, සීමාසහිත එම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, ප්‍රථම මුද්‍රණය 2000, 263 පි.
6. වික්‍රමසිංහ ඩී.පී., **මග දිගට ජනකතා**, ප්‍රසන්න මුද්‍රණ, ප්‍රථම මුද්‍රණය 1971, 26 පිට.
7. ගුණරත්න, ඒ.පී., **රන්මුතුදූව සහ තවත් ජනකතා**, ප්‍රදීප ප්‍රකාශකයෝ, ප්‍රථම මුද්‍රණය 1978, 101 පිට.
8. විජේසූරිය, එස්., **ශ්‍රී ලංකාවේ ජනකතා**, ප්‍රථම කාණ්ඩය 1995, 6 පිට.
9. එම, 63 පිට.
10. ගුණරත්න, ඒ.පී., **රන්මුතුදූව සහ තවත් ජනකතා**, ප්‍රථම මුද්‍රණය 1978, ප්‍රදීප ප්‍රකාශකයෝ, 130 පිට.